සියලු ම හිමිකම් ඇවිරිණි

aat SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අවසාන විභාගය - 2012 ජනවාරි

## (58) බදුකරණය

Taxation

2012-01-21
පෙරවරු
[9.00 – 12.00]

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 06
ප්‍රශ්න ගණන: 05

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

  *(1)* ***සියලු ම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතු ය.***

  *(2) ඉල්ලුම් කරන ලද මාධ්‍යයට අදාලව, එක් භාෂාවකින් පමණක්, ඔබ වෙත සපයන ලද පොත්වල උත්තර ලියන්න.*

  *(3) ගණක යන්ත්‍ර භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

  *(4)* ***පෙරවැඩ*** *සහ සියලු ගණනය කිරීම් සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන* ***උපකල්පන*** *කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*

  *(5) ලකුණු 100.*

---

**01.** 2009 ජනවාරි මස සංස්ථාපනය කරන ලද **සීමාසහිත විට්රා (පෞද්.) සමාගම** වාසික සමාගමක් වන අතර එහි කාර්යාලය සහ කර්මාන්ත ශාලාව රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. සමාගමේ ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත වන්නේ බිම් උළු (floor tiles) සහ බිත්ති උළු (wall tiles) නිෂ්පාදනය කිරීමය. **සීමාසහිත විට්රා (පෞද්.) සමාගමේ** කොටස් ප්‍රාග්ධනයෙන් 60% ක් **සීමාසහිත විට්රා හෝල්ඩින් පොදු සමාගම** සතු වේ.

සියලුම ආදායම් බැර කිරීමෙන් හා වියදම් හර කිරීමෙන් පසු සමාගම 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය රු.1,250,000/- කි. වර්ෂයේ සමාගමේ පිරිවැටුම රු.230,000,000/- කි.

**<u>ගිණුම් වලට සටහන්</u>:**

**<u>1 වන සටහන</u>**

**දේපල, පිරියත හා උපකරණ**

**පිරිවැය**

| විස්තර | 2010.04.01 දිනට ශේෂය රු. | එකතු කිරීම් රු. | ඉවත් කිරීම් රු. | 2011.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම | - | 1,000,000 | - | 1,000,000 |
| ගොඩනැගිලි | 11,000,000 | 1,200,000 | - | 12,200,000 |
| යන්ත්‍ර හා උපකරණ | 24,000,000 | 3,600,000 | - | 27,600,000 |
| මෝටර් වාහන | 15,800,000 | 3,000,000 | 2,500,000 | 16,300,000 |
| පරිගණක දෘඩාංග | 1,000,000 | 750,000 | - | 1,750,000 |
| තොරතුරු තාක්ෂණ මෘදුකාංග | 800,000 | - | - | 800,000 |
| ලී බඩු | 900,000 | 400,000 | - | 1,300,000 |
| **එකතුව** | **53,500,000** | **9,950,000** | **2,500,000** | **60,950,000** |

**ක්ෂය කිරීම්**

| විස්තර | 2010.04.01 දිනට ශේෂය රු. | වර්ෂය සඳහා ක්ෂය රු. | ඉවත් කිරීම් රු. | 2011.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 1,100,000 | 580,000 | - | 1,680,000 |
| යන්ත්‍ර හා උපකරණ | 960,000 | 1,440,000 | - | 2,400,000 |
| මෝටර් වාහන | 3,950,000 | 3,160,000 | 625,000 | 6,485,000 |
| පරිගණක දෘඩාංග | 1,000,000 | 750,000 | - | 1,750,000 |
| තොරතුරු තාක්ෂණ මෘදුකාංග | 400,000 | 100,000 | - | 500,000 |
| ලී බඩු | 225,000 | 400,000 | - | 625,000 |
| **එකතුව** | **7,635,000** | **6,430,000** | **625,000** | **13,440,000** |

(1) 2010 අප්‍රේල් 01 දිනට ඇති සියලුම දේපල, පිරියත හා උපකරණ අයිතමයන් මිලදීගෙන හෝ ගොඩනගා ඇත්තේ 2009 ජනවාරි මස තුළදීය.

(2) සමාගමේ කර්මාන්ත ශාලාව, කාර්යාල ගොඩනැගිලි සහ කළමනාකරුගේ පදිංචිය සඳහා වූ නිවස මෙහෙයුම් කල්බදු ගිවිසුම යටතේ ලබා ගත් ඉඩමේ ඉදිකර ඇත. කල්බදු කාල පරිච්ඡේදය 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වී වර්ෂ 30 කි. වාර්ෂික කල්බදු කුලිය රු.500,000/- ක් වන අතර එය ආදායම් ප්‍රකාශයට හර කර ඇත. ගබඩාවක් ඉදිකිරීම සඳහා තවත් සින්නක්කර ඉඩමක් වර්ෂය තුළදී මිලට ගෙන ඇත. එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කොට 2011 මාර්තු සිට ගබඩාව පාවිච්චි කරනු ලැබේ.

(3) කල්බදු ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වල පිරිවැය පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| කර්මාන්ත ශාලාව හා කාර්යාල ගොඩනැගිලි | 9,000,000 |
| කළමනාකරුගේ පදිංචිය සඳහා වූ නිවස | 2,000,000 |
| **එකතුව** | **11,000,000** |

(4) 2010 අප්‍රේල් 01 දිනට මෝටර් වාහන වල පිරිවැය පහත පරිදි සමන්විත වේ:

| | රු. |
|---|---|
| ව්‍යාපාරික ගමන් සඳහා භාවිත කරන මෝටර් කාර් රථ 2ක් | 5,800,000 |
| ලොරි රථ 4 ක් | 10,000,000 |
| **එකතුව** | **15,800,000** |

(5) අළුත් ලොරියක් 2010 දෙසැම්බර් 01 දින මිලදී ගත් අතර පැරණි ලොරිය 2011 ජනවාරි 31 දින බැහැර කරන ලදී.

(6) 2010 අප්‍රේල් 01 දිනට ඇති පරිගණක දෘඩාංග වර්ෂ 3 ක කාලයක් සඳහා මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ 2010 ජනවාරි 01 දින සිට ලබා ගත් අතර මාසික කල්බදු වාරිකය රු.35,000/- කි. අනෙකුත් පරිගණක වසර තුළදී මිලට ගෙන ඇත.

(7) 2010 අප්‍රේල් 01 දිනට පාවිච්චි කරන පරිගණක මෘදුකාංග ශ්‍රී ලංකාවේදී වැඩි දියුණු කරන ලද ඒවාය.

<u>2 වන සටහන</u>

2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ශුද්ධ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයට හර කරන ලද සමහර වියදම් සහ බැරකළ ආදායම් වල විස්තර පහත පරිදි වේ:

(1) මූල්‍ය කල්බදු පොළී රු.120,000/- කි.

(2) උළු (tile) ඔප දැමීමේ නව යන්ත්‍රයක් පරීක්ෂා කිරීමට තාක්ෂණික අධ්‍යක්ෂවරයාව ඉතාලියට යැවීම සඳහා සමාගම විසින් වර්ෂය තුළ රු.825,000/- ක විදේශ ගමන් වියදමක් දරා ඇත.

(3) **සීමාසහිත විට්රා හෝල්ඩින් පොදු සමාගමට** ගෙවා ඇති කළමනාකරණ ගාස්තුව රු.4,500,000/- කි.

(4) වර්ෂය තුළදී දරා ඇති සංග්‍රහ වියදම රු.75,000/- කි.

(5) ආදායම් ගිණුමට කපා හළ බොල් ණය පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| අස්වූ සේවකයෙකුට ලබා දී ඇති ණය | 10,000 |
| **ජයවර්ධන** (වත්කම් කිසිවක් නොමැති මියගිය ගනුදෙනුකරුවෙකි) | 45,000 |
| ඉතිරි ණයගැතියන්ගෙන් 5% | 120,000 |
| **එකතුව** | **175,000** |

(6) ඉඩම මිලදී ගැනීම සඳහා රු.120,000/- ක නීති වියදමක් දරා ඇත. තවත් රු.30,000/- ක් දිස්ත්‍රික් උසාවියේ ඇති කම්කරු නඩුවක් සඳහා දරා ඇත.

(7) ප්‍රවාරණ වියදම් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| ගුණත්වයෙන් උසස් බිම් උළු (floor tile) හඳුන්වාදීමේ පිරිවැය | 2,512,000 |
| විද්‍යුත් මාධ්‍ය වල ප්‍රචාරණය | 1,950,000 |
| **එකතුව** | **4,462,000** |

(8) වාහන වල අළුත්වැඩියා හා නඩත්තු වියදම්වල විස්තර පහත පරිදි වේ:

| | **කළමනාකරුවන් පාවිච්චි කරන මෝටර් කාර් රථ රු.** | **ලොරි රථ රු.** |
|---|---|---|
| ඉන්ධන | 158,000 | 245,000 |
| අළුත්වැඩියා හා නඩත්තු | 45,000 | 120,000 |
| **එකතුව** | **203,000** | **365,000** |

නොමිලේ සපයන ප්‍රවාහන පහසුකම් වලට අදාල මූල්‍ය නොවන ප්‍රතිලාභය කළමනාකරුවන්ගේ උපයන විට ගෙවීමේ බදු (PAYE) ගණනය කිරීමේදී සලකා ඇත.

(9) සමාගම රජයට රු.480,000/- ක පරිත්‍යාගයක් හා අනුමත පුණ්‍යායතනයක් වන හෙල්ප් ඒජ් ආයතනයට රු.50,000/- ක මුදල් පරිත්‍යාගයක් සිදු කර ඇත.

(10) වෙනත් ආදායම් වල සාරාංශය මෙසේය:

| | රු. |
|---|---|
| ලොරිය විකිණීමෙන් ලත් ලාභය | 100,000 |
| භාණ්ඩාගාර බිල්පත් වල අයෝජනය කිරීමෙන් ලද පොලිය | 450,000 |
| අශ්‍රිත සමාගමකින් ලද ලාභාංශ | 100,000 |
| හිස් භාජන විකිණීමෙන් ලත් ආදායම | 480,000 |

(11) සමාගම රු.1,200,000/- ක් පාරිතෝෂික (gratuity) සඳහා වෙන් කිරීමක් වර්ෂය තුල සිදු කර ඇත. වර්ෂය තුළදී පාරිතෝෂික කිසිවක් ගෙවා නැත.

(12) ආදායම් ප්‍රකාශයට හර කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ විස්තර මෙසේය:

| | රු. |
|---|---|
| ලදුපත් වල අලවන ලද මුද්දර වල පිරිවැය | 23,000 |
| ඉඩම අත්පත් කර ගැනීම සඳහා ගෙවූ මුද්දර ගාස්තුව | 120,000 |
| කල්බදු ගිවිසුම සඳහා මුද්දර ගාස්තුව | 25,000 |

(13) අනෙකුත් වියදම් වල පහත ඒවා ඇතුලත්ය:

| | රු. |
|---|---|
| වාර්ෂික පිරිත් පිංකම සඳහා | 270,000 |
| කම්කරුවෙකු සොරකම් කළ බිම් උළු (floor tiles) වල පිරිවැය | 25,250 |
| **එකතුව** | **295,250** |

<u>3 වන සටහන</u>

තක්සේරු වර්ෂය 2009/10 යෙන් ඉදිරියට ගෙන ආ ආදායම් බදු සඳහා ගලපන ලද ව්‍යාපාරික අලාභය රු.10,652,000/- කි.

<u>4 වන සටහන</u>

වර්ෂය සඳහා ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව (ESC) රු.500,000/- කි. 2010/11 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරු බදු ගෙවීම රු.1,000,000/- කි.

ඉහත තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින්,** 2010/11 තක්සේරු වර්ෂය සඳහා, **සීමාසහිත විවිරා (පෞද්.) සමාගමේ:**

(a) එක් එක් ආදායම් ප්‍රභවයෙන් ලැබුණ ව්‍යවස්ථාපිත ආදායම,

(b) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(c) තක්සේරු කළ හැකි ආදායම,

(d) බදු අයකළ හැකි ආදායම,

(e) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(f) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද

ගණනය කළ යුතු ය.

(VAT, NBT සහ නොබෙදූ ලාභ මත බදු [deemed dividend tax] වල බලපෑම නොසලකා හරින්න.)

(ලකුණු 35)

**02.** වයස අවුරුදු 65 ක් වන විශ්‍රාමික හමුදා නිලධාරියෙක් වන **අබේනායක** වාසික පුද්ගලයෙකි. ඔහු දැනට **ලයන් සෙකුරිටි (පෞද්.) සමාගමේ** ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරියකු ලෙස පූර්ණ කාලීනව සේවය කරයි.

**අබේනායකට** සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයා ඇත්තේ 2010/11 තක්සේරු වර්ෂය සඳහාය. (මින්පසු වර්ෂය ලෙස හඳුන්වයි).

(1) ශ්‍රී ලංකා රජයෙන් ලද මාසික විශ්‍රාම වැටුප රු.35,000/- කි.

(2) **ලයන් සෙකුරිටි (පෞද්.) සමාගමෙන්,** ලද මාසික වැටුප රු.70,000/- කි. ඔහුට රු.150,000/- ක ප්‍රසාද දීමනාවක් 2010 දෙසැම්බර් මස ගෙවා ඇත. 2010/11 වර්ෂයට අදාල රු.200,000/- ක නවත් ප්‍රසාද දීමනාවක් ගෙවා ඇත්තේ 2011 අප්‍රේල් මාසයේදීය. සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල වැටුපෙන් 8% කි.

(3) **අබේනායකට** රාජකාරි හා පුද්ගලික පාවිච්චිය සඳහා ඉන්ධන සහිතව ජීප් රථයක් (3,000 CC) ලබා දී ඇත. **අබේනායක** පුද්ගලික පාවිච්චිය වෙනුවෙන් සේවායෝජකයාට කිසිවක් ගෙවා නොමැති අතර මෙම වාහනය සම්බන්ධයෙන් ධාවන චාර්තා (running charts) පවත්වාගෙන නොතිබුණි.

(4) ඔහු ඔහුගේ පවුල සමග 2010 මාර්තු මස මිලට ගත් මහල් නිවාසයක ජීවත් වෙයි. 2008 ජූනි මස සාදා නිම කළ මහල් නිවස වර්ග අඩි 2,500 කින් යුක්ත වේ. නිවසේ තක්සේරු වටිනාකම රු.140,000/- කි.

(5) ඔහුට පරම්පරාවෙන් උරුම වූ ගමේ පිහිටි නිවස මසකට රු.25,000/- බැගින් 2010 අප්‍රේල් මස සිට කුලියට දී ඇත. නිවස වරිපනම් බදු අයකරන ප්‍රදේශයෙන් බැහැරව පිහිටා ඇත. ඔහු විසින් වර්ෂය සඳහා දරන ලද අලුත්වැඩියා වියදම රු.40,000/- කි.

(6) ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇති රු.2,000,000/- ක ස්ථාවර තැන්පතුව සඳහා **අබේනායක** ලද පොලිය රු.180,000/- කි. භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලිය රු.120,000/- කි.

(7) 1994 අප්‍රේල් 03 දින උපන් **අබේනායකගේ** දියණිය **ශිනිඳුට, සම්පත් බැංකුවේ** බාල වයස්කාර ගිණුමක් ඇති අතර ඉන් රු.8,000/- ක දළ පොලියක් වර්ෂය සඳහා ලැබී ඇත.

(8) **අබේනායකගේ** දියණිය පියා දෙන ලද මුදලකින් ලොතරැයි පතක් මිලට ගත් අතර ඉන් රු.1,000,000/- ක ප්‍රථම ත්‍යාගය දිනා ගන්නා ලදි. රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු රු.900,000/- ක මුදලක් ඇයට ලැබී ඇත.

(9) **අබේනායකට, සීමාසහිත ටොයොඩා පොදු සමාගමෙන්** ලාභාංශ ලැබී ඇති අතර ලාභාංශ පත්‍රිකාවේ පහත තොරතුරු දක්වා ඇත:

| | රු. |
|---|---|
| බද්දට යටත් ලාභයෙන් ගෙවූ, | |
| ශුද්ධ ලාභාංශ | 45,000 |
| ලාභාංශ බදු | 5,000 |
| **දළ ලාභාංශ** | **50,000** |
| බදු නිදහස් ලාභාංශයෙන් ගෙවූ ලාභාංශ | 70,000 |
| | **120,000** |

(10) **අබේනායක** නිවස මිලදී ගැනීම සඳහා **සම්පත් බැංකුවෙන්** ලබා ගත් ණය සඳහා ගෙවන ලද පොලිය රු.132,000/- ක් වන අතර ණය මුදලින් ආපසු ගෙවා ඇති කොටස රු.115,000/- කි.

(11) ඔහු, වර්ෂය තුලදී, පහත සඳහන් පරිත්‍යාගයන් කර ඇත:

| | රු. |
|---|---|
| අනුමත කළ පුණ්‍යායතනයකට මුදලින් කළ පරිත්‍යාගය | 50,000 |
| කොළඹ ජාතික රෝහලේ 48 වාට්ටුවේ නැවත තීන්ත ආලේප කිරීම සඳහා තීන්ත පරිත්‍යාග කිරීම | 90,000 |
| | **140,000** |

(12) ඔහු සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් සඳහා **අබේනායක** විසින් ගෙවූ වාර්ෂික රක්ෂණ වාරිකය රු.8,500/- කි.

(13) වර්ෂය සඳහා අඩු කරන ලද උපයන විට ගෙවීමේ බද්ද රු.64,600/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්:

**ඔබ විසින්,** 2010/11 තක්සේරු වර්ෂය සඳහා, **අබේනායකගේ:**

(a) එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් ලැබුන ව්‍යවස්ථාපිත ආදායම,

(b) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(c) තක්සේරු කළ හැකි ආදායම,

(d) බදු අයකල හැකි ආදායම,

(e) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(f) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද, සහ

(g) බදු නිදහස් ආදායම (වේ නම්),

ගණනය කළ යුතු ය. (ලකුණු 30)

**03.** **ප්‍රේමා** සහ **අමා,** මව සහ දියණිය පිළිවෙලින් 3:1 අනුපාතයට ලාභ බෙදා ගනිමින් රූපලාවන්‍ය ආයතනයක් හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යයි.

2010/11 තක්සේරු වර්ෂය සඳහා විස්තර පහත පරිදි වේ:

| | | රු. | රු. |
|---|---|---|---|
| පිරිවැටුම | | - | 2,200,000 |
| එකතු කළා: ගැනිලි මත පොලිය: | | | |
| **ප්‍රේමා** | | 25,000 | |
| **අමා** | | 8,000 | 33,000 |
| | | | 2,233,000 |
| අඩු කළා: සෘජු වියදම් | | | (430,000) |
| | | | **1,803,000** |
| වෙනත් වියදම්: | | | |
| වැටුප් | **ප්‍රේමා** | 180,000 | |
| | **අමා** | 80,000 | |
| | **ක්ලින්ටන්** | 120,000 | |
| | **පොත් තබන්නා** | 144,000 | |
| ප්‍රාග්ධනය සඳහා පොලිය | **ප්‍රේමා** | 120,000 | |
| | **අමා** | - | |
| ක්ෂය වීම් | | 50,000 | |
| ලිපිද්‍රව්‍ය | | 120,000 | |
| ගෙවල් කුලී | | 180,000 | |
| ප්‍රචාරණය (ප්‍රවර්ධන) | | 80,000 | (1,074,000) |
| **ශුද්ධ ලාභය** | | | **729,000** |

හවුල් ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා කොණ්ඩා කැපීමේ යන්ත්‍රයක් රු.100,000/- ට වර්ෂය තුළදී මිලට ගන්නා ලදී. මේ හැරුනු විට ව්‍යාපාරයේ වෙනත් වත්කම් නැත.

**ප්‍රේමාගේ** ස්වාමිපුරුෂයා වන **ක්ලින්ටන්ට** ගොඩනැගිල්ල අයිති වේ. ඔහු මුදල් අයකැමි ලෙස හවුල් ව්‍යාපාරයේ සේවය කරයි.

**ඉහත දී ඇති තොරතුරු ඇසුරෙන්, ඔබ විසින්:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය / අලාභය.

(b) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු දළ හවුල් ව්‍යාපාර බද්ද.

(c) බෙදිය හැකි ලාභය / අලාභය හවුල්කරුවන් අතර බෙදා හැර එක් එක් හවුල්කරුවන්ගේ ව්‍යාපාරයෙන් ලද ව්‍යවස්ථාපිත ආදායම.

(d) හවුල්කරුවන් දෙදෙනාට හිමි හවුල් ව්‍යාපාර බදු බැර.

2010/11 තක්සේරු වර්ෂය සඳහා ගණනය කරන්න.

(ජාතිය ගොඩනැගීමේ බද්ද [NBT] නොසලකා හරින්න) (ලකුණු 16)

**04.** (a) 2011 වර්ෂයේ බදු අය කළ කාල පරිච්ඡේදයන් සඳහා "වෛකල්පික එකතු කළ අගය මත බදු" (Optional VAT) සඳහා ලියාපදිංචිවීමේ සීමාව (threshold) කුමක්ද? (ලකුණු 04)

(b) එකතු කළ අගය මත බදු පනතට අනුව වලංගු "බදු ඉන්වොයිසියක" අඩංගු විය යුතු කරුණු මොනවාද? (ලකුණු 04)

(මුළු ලකුණු 08)

**05.** (a) බදු පැනවීමේ වගන්තියට අනුව කවර පුද්ගලයන් "ජාතිය ගොඩනැගීමේ බද්ද" ගෙවීමට යටත් වන්නේද? (ලකුණු 04)

(b) දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අදාලව බදු අභියාචනයක (appeal) හා විරෝධතාවයක (objection) වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

*(දේශීය ආදායම් පනත යටතේ වලංගු අභියාචනයක් කිරීමට අවශ්‍ය කොන්දේසි සියල්ල සඳහන් කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා **නොකෙරේ**.)* (ලකුණු 04)

(c) නියමිත දිනට හෝ ඊට පෙර ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 11)

\- o0o -